## ජලය හා ජන දිවිය අතර සම්බන්ධය සිංහල ද්වාරකර්ම චාරිත්‍ර ඇසුරෙන්

චතුරානි.එම්.එස් [1]

පුද්ගලයෙකුගේ ජීවිතයේ සංක්‍රාන්ති අවස්ථාවන් ද්වාරකර්ම ලෙස හඳුන්වයි. ඒ අනුව උපත, වැඩිවියට පැමිණීම, විවාහය, මරණය ලෙස පුද්ගලයෙකුගේ ජීවිතය හා සම්බන්ධ ප්‍රධාන ද්වාරකර්ම කිහිපයකි. සමාජය තුළ තමන්ගේ භූමිකාව කුමක්දැයි, හැසිරිය යුත්තේ කෙසේදැයි, යුතුකම් හා වගකීම් කවරේද, පිළිපැදිය යුතු සාරධර්මයන්, ගුණධර්මයන් කවරේද යන්න මනා අවබෝධයක් ලබාදීමට මෙකී ද්වාරකර්මයන් අත්‍යවශ්‍ය වේ. මේ සඳහා බොහෝ සමාජවල විශේෂ චාරිත්‍ර වාරිත්‍ර හා පිළිවෙත් රටා රාශියක් ගොඩනැගී ඇත. ඇතැම් ද්වාරකර්ම චාරිත්‍ර ඉතාමත් රළුවන අතර පුද්ගලයා සමාජය හා තදින්ම බද්ධ කිරීමටද ඉවහල් වේ. ඒ අනුව පර්යේෂණ ගැටලුව වන්නේ ඉතිහාසයේ පටන් සාම්ප්‍රදායික සිංහල සමාජයේ ද්වාරකර්මයන්ට ජලය කෙතරම් සම්බන්ධ කරගන්නේද යන්න විමසා බැලීමයි. එලෙස සාම්ප්‍රදායික සිංහල සමාජයේ ජලය මූලික කර ගනිමින් සිදු කරනු ලබන ද්වාර කර්මයන් කවරේදැයි සොයා බැලීම මෙහි මූලික අරමුණ වේ.  ද්විතීයික මූලාශ්‍ර ලෙස පොත්පත් සඟරා අන්තර්ජාලය හරහා තොරතුරු ග්‍රහණය කරගනිමින් ගුණාත්මක පර්යේෂක ක්‍රමවේදයක් ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යනය සිදු කරන ලදී. ලබාගත් දත්ත විශ්ලේෂණයේ දී ජීවිතයේ සෑම වැදගත් ද්වාරකර්මයක් හා සම්බන්ධ ජලයට වැඩි වටිනාකමක් ලබාදෙන බව අනාවරණය කරගත හැකි විය. උපත හා සම්බන්ධ ද්වාර කර්මයන් අතර මුලින්ම මව ගැබ්බර වී ඇත්දැයි වෙදෙකු ලවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගැබ්ගෙන සිටින කාලයේදී මෙන්ම  විලි රුදාව ඇති වන අවස්ථාවේදී අංගුලිමාල පිරිතෙන් පිරිත් කරපු පැන් ගැබිනියගේ නළලෙත් කුසෙහිත් කලවාවලත් ගැල්වීම් සිදු කරයි. අලුත උපන් දරුවා දොරට වැඩීමේදී සෙත් පිරිත් ආශිර්වාද කිරීමත් ගමේ වැවට දරුවා රැගෙන ගොස් දරුවාගෙ පියා වතුර පතක් ගෙන *"මේ වැවූ දියත්තත් ගංකරයත් අද පටන් උඹට බාරයි"* කියමින් උරුමය පවරා දීමක් සිදු කරයි. වැඩිවිය පැමිනීම හා සම්බන්ධ ද්වාර කර්මයන් අතර සුබ නැකතට හිස දිය නෑවීම, පිරිසිදු දිය බඳුනකින් තමන්ගේ මුහුණ බැලීමට සැලැස්වීම, දිය කළයක් රැගෙන වැට කඩුල්ල පැනීම ආදිය ඒ අතර වේ. විවාහයේදී මනාලිය මුලින්ම මනාලයා හමුවට දිය බඳුනක් අතැතිව පැමිණීම, පෝරුවට නැගීමට පෙර පා දෝවනය, අත පැන් වැඩීම, අත පැන් වත්කිරීම ආදියද, ජීවිතයේ අවසානය මරණ මංචකයේදී පිරිත් පැන් හිසේ සහ දෙතොලේ තැවරීම, කහ-කොහොඹ වතුරින් මිනිය නෑවීම, පැන් වැඩීම, මිනිය මිහිදන් කල පසු සැකසෙන පස් කණ්ඩිම මත දිය බඳුනක් තැබීම ආදී වශයෙන් ජලය හා සම්බන්ධ චාරිත්‍ර රාශියකි. අතීතයේ ජලය හා සම්බන්ධ ද්වාර කර්මයන් රාශියක් පැවතියද වර්තමානයේ  එය නවීකරණය වෙමින් අභාවයට යන බවක් දැකිය හැකිය. අප ජීවිතය හා සමීපව මෙන්ම වැදගත් කමක් ගනු ලබන ජලය හා සම්බන්ධ ද්වාර කර්මයන් වියැකී යා නොදී අනාගතයට ආරක්ෂා කරගෙන යාම අප සැමගේ වගකීම බව අවසන් වශයෙන් සඳහන් කළ හැකිය.

**ප්‍රමුඛ පද -** *ද්වාරකර්ම, වැඩිවිය හා සම්බන්ධ චාරිත්‍ර, ජලය හා බැඳි චාරිත්‍ර, මිනිස් දිවියයි ජලයයි*

[1] සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. mjsudarshichathurani@gmail.com